# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,198 —1960 සැප්තැම්බර් 13 වැනි අඟහරුවාද — 13.9.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### බෝවෙන රෝග (සත්ව) ආඥාපනත

1947 සැප්තැම්බර් මස 24 වැනි දින හා අංක 9,773 දරණ ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පමුණුවා වෙනස් කරන ලද්දා වූද, 1957 අංක 33 දරණ පනතින් සංශෝධනය කළාවූද, බෝවෙන රෝග ආඥාපනතේ 9 (1) (xviii ඒ) වගන්තියෙන් (327 පරිචේ.) පැවරුණු බලතල යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිවරයා විසින් සම්පාදිත රෙගුලාසියයි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිවරයා.

1960. 10. 9 වැනි දින,
කොළඹ දීය.

#### රෙගුලාසිය

මෙහි උප ලේඛනයේ නියම කර ඇති කවර රටක කවර වරායකින් හෝ අශ්වයෙකු, කොටළුවෙකු හෝ බූරුවෙකු කිසිවෙකු විසින්වත් ලංකාවට ආනයනය නොකළයුතු ය. එසේ කළ යුත්තේ ඒ සඳහා ආණ්ඩුවේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගෙන් හෝ ඔහුගෙන් බලය ලබා සිටින නිලධාරියෙකු ගෙන් ලත් බල පත්‍රයක් උඩය.

අශ්වයෙකු, කොටළුවෙකු හෝ බූරුවෙකු ලංකාවට ගෙන්වා ගන්නා වරාය, අප්‍රිකානු අශ්ව අසනීපය නමැති රෝගයෙන් තොර බව දැන ගෙන සතුටුවූවාට පසු මෙම රෙගුලාසියේ අංක (1) දරණ ඡේදයේ සඳහන් පරිදි ආණ්ඩුවේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරියා විසින් හෝ ඔහුගෙන් බලය ලබාගත් නිලධාරියෙකු විසින් හෝ මේ සඳහා බල පත්‍රයක් නිකුත් නො කළ යුතු සි.

#### උපලේඛනය

රටවල්—
- තුර්කිය
- සිරියාව
- ජොර්දානය
- ඊජිප්තුව
- සවුදි අරාබියාව
- ඉරාකය
- යෙමෙන්
- ඒඩ්න් (ආරක්ෂිත ප්‍රදේශය)
- ඕමාන්
- අප්‍රිකාව
- ඇෆ්ගනිස්ථානය
- ඉන්දියාව
- පකිස්ථානය හා
- ජෝර්ජියාව, ඇසර්බෙයිඩ්සාන්, ආර්මේනියාව, හා එක්සත් සෝවියට් රුසියාවේ ටර්ක්මන් සමූආණ්ඩුව

### 1955 අංක 7 සහ 1957 අංක 30 දරණ ආහාර සැපයීමේ (සංශෝධන) පනත් වලින් සංශෝධිත 1947 අංක 30 දරණ ආහාර සැපයීමේ ආඥාපනත

#### ආඥා පනතේ 4 (2) වගන්තිය යටතේ කෙරෙන නියෝගය

වාණිජ, වෙළඳ ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති තැන්පත් ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම 1947 අංක 30 දරණ ආහාර සැපයීමේ 4 (2) වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, අංක 12,083 සහ 1960 මාර්තු 12 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ 1960 මාර්තු 11 වෙනි දතමින් පළ කරණ ලද නිවේදනය මගින් සංශෝධනය කොට ඇති ආඥාපණතේ උප ලේඛනයට කොල්ලු, පියළි නොකළ මසූර්, පියළි කල කොල්ලු, මසූර් පරිප්පු යන වචන එකතු කිරීමෙන් එකී උප ලේඛනය මෙම නියෝග යෙන් වෙනස් කරමි.

ඒ හේතුවෙන් එම උපලේඛනය දැන් පහත සඳහන් පරිදි කියවේ.

#### උපලේඛනය

- වී
- හාල්
- තිරිඟු
- තිරිඟු පිටි
- සීනි
- ඉන්දියා සමූහාණ්ඩුවේ නිපදවා පිටරට යවන තල් සූකිරි හැර වෙනත් සූකිරි
- ඉන්දියා සමූහාණ්ඩුවේ සහ පකිස්ථානයේ නිපදවා පිටරට යවන හකුරු හැර වෙනත් හකුරු
- රතුළූනු
- කොල්ලු, පියළි නොකල මසූර්, පියළි කළ කොල්ලු, මසූර් පරිප්පු.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

වාණිජ, වෙළඳ, ආහාර සහ නැව් කටයුතු පිළිබඳ
අමාත්‍යාංශය (ආහාර අංශය),
330, යූනියන් පෙදෙස, කොළඹ 2,
1960 සැප්තැම්බර් 9 දින.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයෙහි මුද්‍රණය කරන ලදී.

879—ජේ. ඇන්. ආර් 11848—4,275 (9/60)